# නව සම සමාජයේ අපි ආ ගමන

මේ ලබන දෙසැම්බර් 30 වැනිදාට නව මුහුණුවරකින් සමසමාජ ව්‍යාපාරය කළඑළි බැහැල අවුරුදු 30 ක් සම්පූර්ණ වෙනව. ඒ ලෙසට අපි කිව්වත් ඇත්තටම මේ දේශපාලනයට ඊට වඩා ලොකු වයසක් ගිහින්.

## හැට හතරේ මහා පාවාදීම

1964 ලංකා සමසමාජ පක්ෂය ධනපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමඟ සන්ධානය ආරම්භ කළා. එය අද වෙනකලුත් වෙනස් වෙලා නෑ. එදා හිටිය නායකයෝ වෙනුවට අද ඉන්නේ දුර්වල කොටසක් නිසාත් ඔවුන්ගේ ඇත්ත තත්වය තවත් පහළට වැටිල කියලයි මට හිතෙන්නේ.

64 තීන්දුව ගත්ත වෙලාවේ ක්‍රිස් රත්නායකත් මමත් වරායේ කොමිෂන් සභාවේ සේවකයෝ හැටියට වැඩකළා. ඒ දවස්වල ප්‍රායෝගික පුහුණුව සඳහා වැඩපලවලට ඉංජිනේරු සිසුවන් අරින විධිමත් ක්‍රම තිබුණේ නෑ.

ඒ නිසා අපි එතැනට ගියේ පළමු පංතියේ විදුලි කාර්මිකයෝ හැටියට පත්වීම් ලබාගෙන. එතකොට කුලසිංහ මහත්තයත් එතැන මහ ඉංජිනේරුවා හැටියට හිටිය. විදුලි අංශය භාරව හිටියේ දෙමළ ඉංජිනේරුවෙක් සිවපාත සුන්දරම් කියලා. මහාචාර්ය ශ්‍රියානන්දත් ආධුනික ඉංජිනේරුවෙක් හැටියට වැඩ කළා.

ඒ වෙලාවේ වරායේ කම්කරුවෝ ගිනි අරන් තිබුණේ අලුත් සන්ධානය ගැන. වැඩි දෙනෙක් මේ සන්ධානයෙන් ලොකු වෙනසක් වෙනව කියලා හිතුවා. මට මතකයි අනිල් මුණසිංහ වරාය භාර ඇමතිවරයා හැටියට අපේ වැඩපලවල් බලන්න ආවා. කම්කරුවෝ රැස්කකා හිටියේ වැඩපල තුළ ප්‍රශ්න සාකච්ඡා වෙනව බලන්න. ඒත් අනිල් හිතවතුන් පිරිවරාගෙන පෙළපාළියකින් ෆැක්ටරි තුළින් ගියේ චණ්ඩ මාරුතයක් යනවා වගේ.

ක්‍රිසුත් මාත් දෙන්නම එතකොට සරසවියේ ලංකා සමසමාජ ශාඛාවේ කොළඹ සාමාජිකයෝ. අපි දෙන්නම කම්කරුවන් අතර වාදයට පැටළුනා සභාගය ගැන. එදා මටත් වඩා සභාගයට විරුද්ධව කථා කළේ ක්‍රිස්. ඒත් මං පෙන්නලා දුන්න පක්ෂයෙන් එකවර ඉවත් වෙලා කම්කරු පංතිය අතර ඉන්න අමාරු බව.

වරායේ අපේ පුහුණුව ඉවර වෙලා අපි පේරාදෙණියට ගියා අන්තිම වසර අලුත් ඉංජිනේරු පීඨයේ ගෙවන්න. පේරාදෙණියේදී අපි ඇතුල් වුණා එතැන යන යෝධ විවාදයට විප්ලවයේ ඉදිරි ගමන ගැන. අපි වැඩ පටන් ගත්තේ සරසවි ලෝතලයේ වමේ කොටසක් හැටියට. ආණ්ඩුව වැටීමත් සමඟ අලුත් මඟක් ගැනීම ගැන අදහස වඩා තහවුරු වුණා.

## පරණ සහ නව පරම්පරාවේ සගයින්

එදා මගේ ලොකුම සගයා හැටියට හිටිය ක්‍රිස් රත්නායක අද වෙනකොට හුඟක්ම දුරස් වෙලා. එදා ජාතිවාදයට විරුද්ධව ඉතාම තදින් පෙනී සිටිය ක්‍රිස් අද වෙනකොට ඊට වඩා වෙනස් තැනකට පත්වෙලා කියලයි මට හිතෙන්නේ. ඒ නිසා දිගට වාද කරන එක මං නැවැත්තුවා. එයා ලෝක බැංකුවේ බලශක්ති උපදේශකයෙක් හැටියට ඇමරිකාවේ වොෂිංටන් DC වල පදිංචියට ගිහින් දැන් වසර විස්සකටත් වැඩියි.

පරිසරයේ බලපෑමෙන් මිදිලා මතවාදයක් ගෙන යන්නට අඛණ්ඩ මතවාදී අරගලයක සිටිය යුතුයි. ඒ අතරම කම්කරු පංති ව්‍යාපාරයේ දෛනික අරගලයට බද්ධ විය යුතුයි. මගේ ගමනත් ක්‍රිස්ගේ ගමනත් වෙන් වුනේ මේ කරුණ උඩ කියලයි මට හිතෙන්නේ. ඒත් පරණ කණ්ඩායමේ හිටපු පෝල් තවමත් අප සමඟ ඉන්නවා. පෝල් මට වඩා වසරක් පහළ බැච් එකේ සිටිද්දී තමයි වැඩේට හවුල් වුනේ. අදත් නොසෙල්වී ලෝකේ කොහේ හිටියත් ඉන්න එක ගැන මට තියෙන්නේ ලොකු ගෞරවයක්.

අපේ දේශපාලන මතවාදය එකසේ පිළිනොගත්තත් මං යන ගමනට හැමදා ආශීර්වාද කළේ ඩොනල්ඩ්. ඩොනල්ඩ් මගේ ආනන්දයේ ඉඳලම මිතුරෙක්. පංතියේ එකට හිටපු ඩොනල්ඩ් අදත් ඒ වගේමයි. ගජ පොහොසතෙක් වුණත් ලෝකය ගැන හොඳ දැක්මක් ඩොනල්ඩ්ට තියෙනව.

සමසමාජය විප්ලවකාරි තලයකට යළ ගොඩනැගීමට අප ගෙන ගිය අරගලයේදී නොසැලී මා සමඟ හිටපු කීප දෙනෙක්ම නායකයෝ හැටියට අද ඉන්නවා.

ලීනස් ජයතිලක අද ලංකාව පුරා, නැත්නම් ලෝකය පුරා ගොවි ධීවර ජන අරගලය ගැන උනන්දුවෙන් ක්‍රියා කරමින් ඉන්නේ. ප්‍රධාන කම්කරු නායකයෙක් වන අතරම අනෙක් පීඩිත ජනතාව ගැන හිත යොමු කළ වෙනත් නායකයෙක් නැති තරම්.

නිල් විජේතිලකත් ප්‍රධාන වෘත්තීය සමිති නායකයෙක්. ඒ වගේම ඉතාම තියුණු න්‍යායික වැඩකාරයෙක්. සරසවි විවාදවලදී ඔහු ඉදිරියේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ කීප දෙනෙක්ම නිරුත්තර වුණා. එවගේ ජාත්‍යන්තරවාදයේ ඔහු හැම විටම කැප වෙලයි ඉන්නේ.

අසිරිමත් දෙමළ මාක්ස්වාදයෙක් වූ අන්නමලෙ සමඟ අපට ගැටී. අපට එක් වුණ තිරුණාවුකරසු අද පතල විප්ලවවාදී දෙමළ ලේඛකයෙක්. ඔහුගේ කොළමක් දෙමළ පත්‍රයක සතිපතා පළවෙන නිසා ප්‍රචලිත වමේ දෙමළ නායකයෙක්.

ඊට පස්සේ එකතු වුණ ඊළඟ පරම්පරාවේ කිව හැකි කීප දෙනෙක්ම ඉන්නවා දැනටමත් විවිධ ක්ෂේත්‍රවල නම් දරාපු. රනත් නමගිය මාක්ස්වාදී ගුරුවරයෙක්. එනිසා විවිධ අය ඔහු හමුවන්න එනවා ප්‍රශ්න නිරාකරණය කරගන්න.

ජෙනගන් අපට ඉන්න හොඳම දෙමළ කථිකයා. ඔහුගේ කතා අහන් හිටියාම දෙමළ නොතේරුණත් අත්පොලසන් දෙන්න හිතෙනව. දෙමළ පත්‍රය භාර එයාට.

චමිල් දැන් වෙනම නායකයෙක්. ජනාධිපති අපේක්ෂකයට වඩා ජාතිවාදීන් සමඟ එළිපිට ගැටුන එඩිතරයෙක් හැටියට නම අරන් ඉන්නේ.

කොත්තිගොඩ රටේ විතරක් නෙවෙයි ලෝකයේ ප්‍රසිද්ධ පුද්ගලයෙක්. ටෙලිවිෂන් වාදවලිනුත් ලොකු නමක් හදාගත්තා.

ධර්මසිරි ලංකාපේලි මාධ්‍ය ක්ෂේත්‍රයේ ජගතෙක්. ඒ වගේම ශූර වෘත්තීය සංගම්කාරයෙක්. හීන් නූලෙන් වාද කරන මිනිහට ගහන්න කෙනෙක් නෑ.

ජෙරාඩ් වගේම ප්‍රියන්තත් ලොකු වෘත්තීය සමිතිකාරයෝ. ලේසියෙන් කඩේ අරින්න බැරි විශ්වසනීය නායකයෝ හැටියට රාජ්‍ය හා සංස්ථා ක්ෂේත්‍රවල මේ දෙන්න නම් දරල ඉන්නේ.

රට පුරා ගොඩනැගුනු තව ගොඩක් දක්ෂයෝ ඉන්නව. අවුරුදු 40 කටත් වඩා වැඩි දේශපාලන ගමනකින් පස්සේ දක්ෂයෝ පිරිසක් සමඟ ඉන්න පුළුවන් වීම මං ලබපු ලොකුම භාග්‍යයයි.

ආපු ගමන හරිම සතුටුදායකයි. තවම ගමන ඉවර නෑ, මේ 30 වැනිදා කොළඹ නව නගර ශාලාවේදී හවස දෙකට හමුවෙමු.